We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

3 වන පිටෙන්

මේසයේදී රජයේ සාකච්ඡා කණ්ඩායම එල්.ටී.ටී.ඊ. සංවිධානය අසීරු තත්ත්වයකට පත් කරමින් කරුණු ඉදිරිපත් කිරීමෙන් එය තවදුරටත් තහවුරු කිරීමට සමත්ව ඇත. සටන් විරාමය නොතකා හරිමින් හිටපු විදේශ කටයුතු ඇමැති ලක්ෂ්මන් කදිරගාමර් මහතා ඝාතනය කිරීම, හමුදා සාමාජිකයන් සහ පොලිස් නිලධාරීන් ඝාතනය කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය පියවර ගෙන ඇති ආකාරය සම්බන්ධයෙන් න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් ඇතුළු පිරිස වික්ෂිප්ත වන ආකාරයෙන් කරුණු දැක්වීමට රජයේ සාකච්ඡා කණ්ඩායම සමත්වීම එල්.ටී.ටී.ඊ.යේ දෙබිඩි පිළිවෙත ජාත්‍යන්තර ප්‍රජාවට කියා පෑමට තවත් කදිම සාධකයක් විය. ලෝක පූජිත දේශපාලන චරිතයක් වන ලක්ෂ්මන් කදිරගාමර් මහතා ඝාතනය, කරුණා අම්මාන් පාර්ශවයේ වැඩක් යයි පෙන්වීමට බාලසිංහම් උත්සාහ කරද්දී එම සිද්ධියට සම්බන්ධ වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින්ගේ ඇඟිලි සළකුණු පවා පෙන්වමින් පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතා ඇතුළු රජයේ සාකච්ඡා කණ්ඩායම කටයුතු කර තිබූ ආකාරය ඉදිරියේ නිරුත්තරව බලා සිටීමට කොටි සංවිධාන න්‍යායාචාර්යවරයාට සිදුව ඇත. එම සංවිධානය සටන් විරාමය නොතකා හරිමින් කටයුතු කිරීමේ භාවිතයක් සහිත විශ්වාසය තැබිය නොහැකි සංවිධානයක් බැවින් ලබන සාකච්ඡා වටය සඳහා සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමේ වාර්තාවක් ලබා ගනිමින් සාකච්ඡා ඇරඹීම වැනි කාරණා කොටින්ට සහනයක් විය නොහැක.

එහෙත් විලංගු වැටුණු කොටි කෙසේ කටයුතු කරාවි දැයි ඊට පෙර කාටවත් පැවසිය නොහැකි ය. එනිසා එදෙස සෝදිසියෙන් බලා සිටීම රජය, ජාත්‍යන්තර ප්‍රජාව ඇතුළු සියළු පාර්ෂවයන්ගේ වගකීමයි.
මෙවර ජිනීවා නුවර පැවති සාකච්ඡා වටය දෙස තීක්ෂණව බැලීමේදී රජයේ නියෝජිත කණ්ඩායම එහිදී පෙනී සිටි ආකාරය සහ කරුණු ඉදිරිපත් කරමින් කටයුතු කළ ආකාරය පැසසිය යුතුව ඇත.

එමෙන්ම පසුගිය එක්සත් ජාතික පෙරමුණු රජය යටතේ එවකට පැවති රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවති සාකච්ඡා වට හයේදීම දක්නට නොලැබුණු ආකාරයේ ආත්ම විශ්වාසයක් සහිතව සහ විශ්වාසනීය පදනමකින් යුතුව එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ අදහස් හුවමාරු කර ගනිමින් තර්ක විතර්ක කිරීමට ඉදිරිපත්ව ඇති බව දක්නට ඇත. කොටි සංවිධානය සමඟ අවබෝධය වර්ධනය කර ගැනීම සඳහා බාධාවක් වේ යැයි හෝ දෙපාර්ශවය අතර මතබේදයට එසේත් නැත්නම් තවදුරටත් අමනාපයට කාරණයක් වේ යැයි නොසිතමින් දැඩිව කටයුතු කිරීම, රාජ්‍ය තාන්ත්‍රිකභාවය ආරක්ෂා කර ගැනීමටත් සටන් විරාමය ආරක්ෂා කර ගැනීම සඳහා රජයේ තිබෙන කැපවීම ප්‍රදර්ශනය කිරීමටත් හේතු වූ බව නිසැකය. එහෙත් පවතින අවස්ථා ප්‍රයෝජනයට ගෙන එල්.ටී.ටී.ඊ. සංවිධානය ජාත්‍යන්තරය ඉදිරියේ සාධාරණීකරණය වීම සඳහා කටයුතු කිරීමේ ඉඩකඩද පවතින බව තේරුම් ගනිමින් කටයුතු කිරීමේ වගකීමක් ඇති බව රජයේ සාකච්ඡා කණ්ඩායමද තේරුම් ගත යුතුව ඇත.

කරුණා අම්මාන්ගේ නායකත්වයෙන් යුතු එම පාර්ශවය ප්‍රමුඛ ප්ලොට්, ටෙලෝ, ඊ.පී.ආර්.එල්.එෆ් (වර්ධන කණ්ඩායම) ඊ.පී.ඩී.පී. වැනි නිල නොවන හමුදා කණ්ඩායම් නිරායුධ කළ යුතු බව කොටි සංවිධානය පවසයි. නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වනවා යයි පවසන වෙනත් කණ්ඩායම් කෙසේ වෙතත් කරුණා පාර්ශවය කොටි සංවිධානයේ කටයුතු සඳහා මහා හිසරදයක් බව ඔවුන් හොඳින් දනී. ආණ්ඩුව

මෙවර ජිනීවා නුවර පැවති සාකච්ඡා වටය දෙස තීක්ෂණව බැලීමේදී රජයේ නියෝජිත කණ්ඩායම එහිදී පෙනී සිටි ආකාරය සහ කරුණු ඉදිරිපත් කරමින් කටයුතු කළ ආකාරය පැසසිය යුතුව ඇත.

මාර්ගයෙන් කරුණා පාර්ශවය නිරායුධ කර ගැනීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය උත්සාහ කරනුයේ එනිසාවෙනි. මෙවන් අවස්ථාවකදී නිර්මාණය වෙමින් පවතින සාමකාමී පරිසරයට බාධාවක් වන ලෙස කරුණා හෝ වෙනත් පාර්ශවයක් කටයුතු කරයි නම් එය සාධාරණයයි පැවසිය නොහැක. එහෙත් කරුණා පාර්ශවය හැරුණු කොට අනෙකුත් සංවිධාන නිරායුධ කරණු ලැබුයේ සටන් විරාම ගිවිසුමට අත්සන් තැබූ පසුගිය 2002 වසරේදීමය. ඔවුන් නැවතත් අවි ගෙන ඇත්නම් ඒ සඳහා පරිසරය නිර්මාණය කර ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානය මිස රජය නොවන බව කොටි සංවිධානයට මතක් කර දිය යුතුව තිබුණි. එමෙන්ම කරුණා අම්මාන් පිළිබඳ ප්‍රශ්නය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් යයි එම ප්‍රශ්නය ඇරඹුණු සමයේදී ප්‍රකාශ කළේ එම සංවිධානයේ න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම්ම මිස වෙන කවුරුවත් නොව එය අපගේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවත් එය අප කෙටි කාලයකින් විසඳා ගන්නා බවත් එම කාලයේදී ප්‍රකාශ කළ ඇන්ටන් බාලසිංහම් අද වෙනත් දෙයක් පැවසීමට ඉදිරිපත්ව සිටින්නේ තත්ත්වය හිතුවාට වඩා බරපතල බව කොටි සංවිධානයට දැනෙන්නට වී ඇති නිසා විය හැකිය.

කෙසේ වුවද ජිනීවා නුවර දී රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය එකඟතාවයකට පැමිණ නිකුත් කළ ප්‍රකාශය සම්බන්ධයෙන් රජයට සහය දක්වන ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික හෙළ උරුමයත් යම් විරෝධතාවයක් මතු කර ඇත. සාකච්ඡා සිදු කෙරුණු ආකාරය පිළිබඳව සෑහීමකට පත් වූවත් එකඟතා ලියවිල්ලට එකඟ විය නොහැකි බව ඔවුහු පවසති. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ පැවති ගිවිසුම සංශෝධනය කිරීමට පියවර නොගෙන සටන් විරාම ගිවිසුම ශක්තිමත් කිරීමට හා සංවර්ධනය කිරීමට රජය පිළිගෙන තිබීම පිළිබඳවයි. සටන් විරාම ගිවිසුම ව්‍යවස්ථා විරෝධී බව සාකච්ඡා මේසයේදී ප්‍රකාශ කළ නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු රජයේ නියෝජිත පිරිස එකඟතා ප්‍රකාශනයෙන් සටන් විරාම ගිවිසුම පිළිගෙන ඇති බව පවසති. වරදක් හෝ අඩුපාඩුවක් සිදුව ඇත්නම් දකුණ හා පැවති එකඟතා අවුල් කර නොගෙන ඒ පිළිබඳව සාකච්ඡා කිරීමටත් වැරදි නිවැරදි කර ගැනීමටත් තීක්ෂණව කටයුතු කිරීමට දකුණේ දේශපාලන නායකයන් ප්‍රවේශමෙන් කටයුතු කළ යුතුව ඇත. එසේ නොවුවහොත් එල්.ටී.ටී.ඊ. සංවිධානය බලාපොරොත්තු වන සාධක දකුණේ මතු කිරීමට හෝ එම සංවිධානයට පහසුවෙන් සටන් විරාම ගිවිසුමෙන් පැන යාමට ඉඩ නොතැබිය යුතුව ඇත. එසේ වුවහොත් ''අඬන්නට සිටින ළමයාගේ ඇහැට අනින්නා සේ'' සිදුවන්නේ එල්.ටී.ටී.ඊ. බලාපොරොත්තු ඉටු කිරීමකි. එම සංවිධානය බලාපොරොත්තු වන සාධක දකුණේ නිර්මාණය කිරීමකි. දකුණ වියවුල්ව පවතින විට එල්.ටී.ටී.ඊ. සංවිධානයට ජාත්‍යන්තරව හා දේශීයව පෝෂණය වීමට හේතුවන බව එම සංවිධානය දනී. ඒ පිළිබඳව දකුණද අවබෝධයකින් කටයුතු කළ යුතුය.

**කාශ්‍යප මල්ලවආරච්චි**